අල් හම්දුලිල්ලාහිල්ලදී රද්ද කයිදහූ ඉලල් වස්වසති" (අල්ලාහ් අති ශේර්ෂ්ඨය, අල්ලාහ් අති ශේර්ෂ්ඨය, ෂෙයිතාන්ගේ කෙඳිරීම හටගත් විගස ඔහුගේ කුමන්ත්රණය ඔහු වෙතම යළි හරවා යැවූ තැනැත්තාටම සියලු ප්රශංසා) යැයි පැවසූහ

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ, "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, අප අතරින් යමෙක් ඔහුගේ සිත තුළ යමක් -ප්රදර්ශණය වීම- දකියි. ඒ ගැන කතා කිරීමට වඩා අළු
බවට පත් වීම ඔහුට වඩාත් ප්රිය ජනකය" යැයි පැවසීය. එවිට එතුමාණෝ: "අල්ලාහු අක්බර්, අල්ලාහු අක්බර්, අල් හම්දුලිල්ලාහිල්ලදී රද්ද කයිදහූ ඉලල් වස්වසති" (අල්ලාහ් අති ශේර්ෂ්ඨය, අල්ලාහ් අති ශේර්ෂ්ඨය, ෂෙයිතාන්ගේ කෙඳිරීම හටගත් විගස ඔහුගේ
කුමන්ත්රණය ඔහු වෙතම යළි හරවා යැවූ තැනැත්තාටම සියලු ප්රශංසා) යැයි පැවසූහ.
[صحيح] [رواه أبو داود والنسائي في الكبرى]

මිනිසෙකු නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණ: "අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, සැබැවින්ම අප අතර සිටින ඇතැමුන් තම සිතට ප්රදර්ශණය වන ඇතැම් කරුණු දකියි. නමුත් ඒ ගැන කතා කිරීම බරපතළ වේ. එබැවින් එය කතා කිරීමට වඩා තමන් අළු බවට පත්වීම වඩාත් හොඳ යැයි සිතයි." යනුවෙන් පැවසුවේය. දූතයාණන් දෙවරක් "අල්ලාහු අක්බර්" අල්ලාහ් අති ශේර්ෂ්ඨය, යැයි තක්බීර් පවසා ෂෙයිතාන්ගේ කෙඳිරීම හටගත් විගස ඔහුගේ කුමන්ත්රණය ඔහුටම යළි හරවා යැවීම සම්බන්ධයෙන් එතුමාණෝ අල්ලාහ්ට ප්රශංසා කළහ.

https://sunnah.global/hadeeth/si/show/65012